ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **දිනය** | : 2019 පෙබරවාරි 11 |

## ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ පාලිත, උපපාලිත සහ ආයෝජන වත්කම් විකිණීම

ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ පාලිත, උපපාලිත සහ ආයෝජන වත්කම් විකිණීම සහ ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා මහබැංකුවේ මැදිහත්වීම සම්බන්ධයෙන් සමහර වැරදි තොරතුරු සංසරණය වන බව ශ්‍රී ලංකා මහබැංකුවේ අවධානයට ලක් වී ඇත.

ඉහත කී ගනුදෙනුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහබැංකුව පහත සඳහන් පරිදි කරුණු පැහැදිළි කර සිටී.

(1) ශ්‍රී ලංකා මහබැංකුව විසින් සෑම අවස්ථාවකදීම අවධාරණය කරනු ලැබුවේ ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ තැන්පත්කරුවන් වෙත උපරිම ප්‍රතිලාභයක් ලබාදෙන පරිදි "හඳුනාගත් වත්කම්" සම්පූර්ණයෙන්ම අපේක්ෂිත ගැනුම්කරුවෙකුට විකිණීම සිදුකළ යුතු බවයි.

(2) මුදල් මණ්ඩලයේ ස්ථාවරය වූයේ ශ්‍රී ලංකා මහබැංකුවේ නියාමනයට ලක් වන ආයතනයන්හි ආයෝජනය කිරීම හෝ ඒවායේ වත්කම් මිලදී ගැනීම සම්බන්ධ ඕනෑම සාකච්ඡාවක් අදාළ ආයතනය සමඟ සෘජුවම සිදු කළ යුතු බවයි. එබැවින්, ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ ආයෝජනයට සහ/ හෝ එහි වත්කම් මිලදී

ගැනීමට අදාළ වන සියළුම ඉල්ලීම් ආයතනය වෙතට යොමුකරන ලදී. ඒ අනුව, ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ වත්කම් මිලදී ගනු ලබන පාර්ශ්වය තෝරාගැනීම ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද අතර, තැන්පත්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කරනු වස්, අදාළ වන නීති සහ රෙගුලාසිවලට යටත්ව ගනුදෙනුව සිදුකිරීම ඇතුළු විවිධ කොන්දේසි පනවමින් මුදල් මණ්ඩලය විසින් අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලදී.

(3) අපේක්ෂිත ගැනුම්කරුවන් විසින් ඇ.ඩො.මි. 61 සිට ඇ.ඩො.මි. 75 දක්වා පරාසය තුළ විවිධ ලංසු තබන ලද අතර, ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරන ලද පාර්ශ්වයට මුදල් මණ්ඩලයේ අනුමැතිය පළ කරන ලද අතර එම පාර්ශවය ඉදිරිපත් කරන ලද ලංසුව, ඊළඟට තැබූ වැඩිම ලංසුවට වඩා ඇ.ඩො.මි. 14 කින් වැඩි වූ ඇ.ඩො.මි. 75 ක ඉහළම ලංසුව විය. තවද, ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද එකම පාර්ශ්වය වූයේ වත්මන් ගැනුම්කරුවායි. ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ තැන්පත්කරුවන්ට හොඳම ප්‍රතිලාභ ලබාදීමට මුදල් මණ්ඩලය විසින් ඇ.ඩො.මි. 60 ක මුල් ලංසුව ඇ.ඩො.මි. 75 දක්වා ඉහළ දැමීමට මැදිහත් වන ලදී.

(4) අදාළ ගනුදෙනුව පවතින නීති සහ රෙගුලාසිවලට යටත්ව සිදුකරන ලෙසට ශ්‍රී ලංකා මහබැංකු නිරන්තරයන්ම අවධාරණය කරන ලදී. ඒ අනුව, පිළිගත් බැංකු පද්ධතියක් මාර්ගයෙන් ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙත යොමුකරන ලද ගනුදෙනුවේ සෑම වාරිකයක්ම අදාළ නීති සහ රෙගුලාසිවලට යටත්ව යථායෝගී පරීක්ෂණ සිදු කර අදාළ බැංකු විසින් අරමුදල් නිශ්කාෂණය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කරන ලදී.

මේවනවිට, මුළු මුදල වන ඇ.ඩො.මි. 75 න් ඇ.ඩො.මි. 54 ක ප්‍රමාණයක් ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙත ලැබී ඇති අතර, එය මූලික වශයෙන් ආයතනයේ තැන්පතුවලින් 20% ක් ගෙවීම සඳහා භාවිතා කරන ලදී. තවද, නොයෙකුත් හේතූන් මත පමා වූ ඇ.ඩො.මි. 16 ක මුදල 2019 පෙබරවාරි මස තුල ආයතනය වෙත ලැබීමට සලස්වන බව ගැනුම්කරුවා විසින් දන්වා ඇත.